# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 33 දරන
# මුස්ලිම් පල්ලි සහ පුණ්‍ය භාර හෝ වකුප් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 සැප්තැම්බර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 සැප්තැම්බර් 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.10 යි 　　　　 තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1982 අංක 33 දරන මුස්ලිම් පල්ලි සහ පුණ්‍ය භාර හෝ වකුෆ් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 සැප්තැම්බර් මස 23 වන දින.]

**එල්. ඩී.—ඕ. 6/81**

**1956 අංක 51 දරන මුස්ලිම් පල්ලි සහ පුණ්‍ය භාර හෝ වකුෆ් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1982 අංක 33 දරන මුස්ලිම් පල්ලි සහ පුණ්‍ය භාර හෝ වකුෆ් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1956 අංක 51 දරන පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 51 දරන මුස්ලිම් පල්ලි හා පුණ්‍ය භාර හෝ වකුෆ් පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ:—

> "සංස්ථාගත කරනු ලැබුව ද නොලැබුව ද සියලු මුස්ලිම් පල්ලි, මුස්ලිම් සිද්ධස්ථාන හා ආගමික ස්ථාන ලියා පදිංචි කිරීම සඳහා විධිවිධාන සැලසීම පිණිස ද, ලියා පදිංචි කරනු ලැබූ මුස්ලිම් පල්ලිවල, මුස්ලිම් සිද්ධස්ථානවල, ආගමික ස්ථානවල හා මුස්ලිම් පුණ්‍ය භාරවල හෝ වකුෆ් භාරවල භාරකරුවන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නියම කිරීම පිණිස ද, මුස්ලිම් පුණ්‍ය අරමුදලක් පිහිටුවීම පිණිස ද, මුස්ලිම් දේපළ උරුමවීමේ හා "වකුෆ්" ආඥාපනතේ II වන පරිච්ඡේදය ඉවත් කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඒවාට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස ද වූ පනතකි.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට පෙරාතුව ම වූ ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට පෙරාතුව ම සඳහන් වන ශීර්ෂ පාඨය වෙනුවට පහත සඳහන් ශීර්ෂ පාඨය මෙයින් ආදේශ කරනු ලැබේ:—

"I වන කොටස

කාර්ය මණ්ඩලය, මණ්ඩලය සහ විනිශ්චයාධිකාරය.".

කොමසාරිස්, නියෝජ්‍ය කොමසාරිස් ආදීන් අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ ආදීන් වශයෙන් හැඳින්වීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි, "කොමසාරිස්, නියෝජ්‍ය කොමසාරිස්, නියෝජ්‍ය කොමසාරිස්වරු සහ කොමසාරිස්වරයාගේ" යන වචන යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට පිළිවෙළින් "අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු සහ අධ්‍යක්ෂවරයාගේ" යන වචන ආදේශ කිරීමෙන්, ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඉවත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

1—ඒ64369 (82/01)

*ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

*"නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් විසින් අධ්‍යක්ෂවරයාගේ බලතල ක්‍රියාවේ යෙදීම හා කාර්ය ඉටු කිරීම කළ හැකි බව.*

4. අධ්‍යක්ෂවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු විසින් අධ්‍යක්ෂවරයාගේ බලතල අතුරින් යමක් ක්‍රියාවේ යෙදීම ද කාර්ය අතුරින් යමක් ඉටු කිරීම ද කළ හැකි ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ අගට පහත සඳහන් අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයා හැර, සාමාජිකයන් ගෙන් කෙනකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ යම් සාමාජිකයකු සිය කාර්ය නියි පරිදි ඉටු නොකරන බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, ඔහු විසින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ යම් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කිරීම පිළිබඳව කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (ඉ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඉ) 5(4) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් ; හෝ", සහ

(ආ) (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඊ) අමාත්‍යවරයා වෙත ඔහු විසින් යවනු ලබන සිය අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) සභාපතිවරයා ඔහු පැමිණ සිටින මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් අතුරින් අයෙකු එම රැස්වීමේ මූලාසනය දැරීමට ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතු ය."; සහ

(ආ) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ ඡන්ද සමානව බෙදී ඇති අවස්ථාවක සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට, සාමාජිකයකු වශයෙන් ඔහුට හිමි ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.".

**10.** මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති, 9අ වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 9ආ, 9ඇ, 9ඈ, 9ඉ, 9ඊ, 9උ, 9ඌ, සහ 9එ යන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 9ආ, 9ඇ, 9ඈ, 9ඉ, 9ඊ, 9උ, 9ඌ සහ 9එ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"සාක්ෂිකරුවන් කැඳවීම ආදියට මණ්ඩලයට ඇති බලය.

**9ආ.** යම් කාරණාවක් සලකා බලා ඒ පිළිබඳව තීරණයක් ගැනීමේ කාර්යය සඳහා මණ්ඩලයේ සභාපතිවරයාට හෝ මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය සභාපතිවරයා විසින් නොදරනු ලබන්නේ නම්, ඒ රැස්වීමේ සභාපතිවරයාට—

(අ) සාක්ෂිකරුවන් කැඳවීමට සහ ඔවුන්ට පැමිණීමට බල කිරීමට

(ආ) ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීමට, සහ

(ඇ) සාක්ෂිකරුවන් ලවා දිවුරුම් හෝ ප්‍රතිඥා කරවීමට

බලය තිබිය යුතු ය.

මණ්ඩලයට කරන ඉල්ලීම.

**9ඇ.** මේ පනත යටතේ මණ්ඩලයට කරනු ලබන ඉල්ලීමක් නියමිත ආකාරයට තිබිය යුතු ය.

වකුප් විනිශ්චය අධිකාරය.

9ඈ. (1) මේ පනතේ කාර්ය සඳහා වකුප් විනිශ්චය අධිකාරයක් හෝ අමාත්‍යවරයා විසින් කලින් කලට නිශ්චය කරනු ලබන විනිශ්චය අධිකාර සංඛ්‍යාවක් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු අතර ඒ එක් එක් විනිශ්චය අධිකාරය මුස්ලිම්වරුන් වන්නා වූ පුද්ගලයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, සාමාජිකයන්ගෙන් එක් අයකු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(3) විනිශ්චය අධිකාරයේ ගණපූරණය සඳහා සාමාජිකයන් දෙදෙනකු පැමිණ සිටිය යුතු ය. ගණපූරණය වන සාමාජික සංඛ්‍යාව පැමිණ ඇත් නම් මිස, විනිශ්චය අධිකාරය විසින් කිසිම කාරණයක් විභාග නොකළ යුතු ය.

(4) යම් කාරණයක් විභාග කිරීමට පැමිණ සිටින සාමාජිකයන්ගෙන් බහුතර සංඛ්‍යාවේ තීරණය, සියලු කාර්ය සඳහා විනිශ්චය අධිකාරයේ තීරණය ලෙස සැලකිය යුතු ය.

මණ්ඩලයේ පොදු බලතල.

9ඉ. (1) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල වලට මුස්ලිම් පුණ්‍ය භාරයකට හෝ වකුප් භාරයකට අදාළව පනත සඳහන් සියලුම කාර්ය හෝ එයින් යම් කාර්යයක් සම්බන්ධව විධිවිධාන සැලසෙන ආඥාවක් සඳහා වූ යම් ඉල්ලීමක් විභාග කර තීරණය කිරීමේ බලය ඇතුළත් වේ—

(අ) භාරයේ හෝ වකුප් භාරයේ යම් භාරකරුවකු ධුරයෙන් ඉවත් කිරීම;

(ආ) අවශ්‍ය අවස්ථාවන් හි දී භාරයට නැතහොත් වකුප් භාරයට භාරකරුවකු හෝ භාරකරුවන් පත් කිරීම;

(ඇ) විනිශ්චය අධිකාරයට හෝ මණ්ඩලයට ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස විධාන කිරීම;

(ඈ) භාරයේ හෝ වකුප් භාරයේ යම් නිශ්චිත අරමුණක් සඳහා භාරයේ නැතහොත් වකුප් භාරයේ දේපළෙහි කවර අනුපාතයක් හෝ එහි ඇති හිමිකමක කවර අනුපාතයක් වෙන් කළ යුතු දැයි ප්‍රකාශ කිරීම;

(ඉ) භාරයේ හෝ වකුප් භාරයේ කළමනාකරණය සඳහා ක්‍රමයක් සකස් කිරීම;

(ඊ) භාරයේ නැතහොත් වකුප් භාරයේ භාරකරු හෝ භාරකරුවන් විසින් යම් ක්‍රියාවක් එසේම ඉටුකළ යුතු බව විධාන කිරීම;

(ඇ) භාරයේ හෝ වකුප් භාරයේ යම් භාරකරුවකු යම් ව්‍යතික්‍රමයක්, විශ්වාසය කඩකිරීමක් හෝ කාර්ය පැහැර හැරීමක් සම්බන්ධයෙන් වරදකරු බව ප්‍රකාශ කිරීම;

(ඈ) යම් ව්‍යතික්‍රමයක්, විශ්වාසය කඩකිරීමක් හෝ කාර්ය පැහැර හැරීමක් සම්බන්ධයෙන් අලාභ වශයෙන් යම් මුදලක් භාරයේ හෝ වකුප් භාරයේ අරමුදලට ගෙවන ලෙස භාරයේ හෝ වකුප් භාරයේ යම් භාරකරුවකුට නියම කිරීම; සහ

(එ) (අ) සිට (ඈ) දක්වා ඡේදවල නිශ්චිතව දක්වා ඇති කරුණුවලින් හටගන්නා වූ වැඩිපුර සහ වෙනත් සහනයන් ප්‍රදානය කිරීම.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානයන්ට යටත්ව, මුස්ලිම් පුණ්‍ය භාරයක් නැතහොත් වකුප් භාරයක් සම්බන්ධයෙන් වූ සෑම ඉල්ලීමක් ම ඒ සඳහා මණ්ඩලය විසින් කරන ලද විධානයක් මත අධ්‍යක්ෂවරයා විසින් හෝ ඒ භාරය හෝ වකුප් භාරය පිළිබඳව සම්බන්ධතාවක් ඇති තැනැත්තන් පස්දෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් හැර වෙනත් කවර වූ හෝ ඉල්ලීමක් මණ්ඩලය විසින් අනුමත කරන ලද බවට අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිත සහතිකයක් සමඟ වුවහොත් මිස මේ වගන්තිය යටතේ විනිශ්චය අධිකාරය විසින් සලකා නොබැලිය යුතු ය.

(4) මුස්ලිම් පුණ්‍ය භාරයක් නැතහොත් වකුප් භාරයක් පිළිබඳ සම්බන්ධතාවක් ඇති තැනැත්තන් පස්දෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කර ඇති අවස්ථාවක දී එයින් එක් තැනැත්තකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එයින් ඉවත් වීම, ඉල්ලීම කළ තැනැත්තන්ගෙන් යටත් පිරිසෙයින් එක් අයකු හෝ පාර්ශ්වකරුවකු වශයෙන් සිටින තාක් කල් එකී ඉල්ලීම විභාග කර තීරණය කිරීමෙන් විනිශ්චය අධිකාරය නොවැළැක්විය යුතු ය.

සාක්ෂිකරුවන් කැඳවීම ආදියට විනිශ්චය අධිකාරයට ඇති බලය.

9ඊ. යම් කාරණයක් සලකා බලා ඒ පිළිබඳව තීරණයක් ගැනීමේ කාර්යය සඳහා විනිශ්චය අධිකාරයේ සභාපතිවරයාට සහ විනිශ්චය අධිකාරයේ යම් රැස්වීමක මූලාසනය සභාපතිවරයා විසින් නොදරනු ලබන්නේ නම් ඒ රැස්වීමේ සභාපතිවරයාට,—

(අ) සාක්ෂිකරුවන් කැඳවීමට සහ ඔවුන්ට පැමිණීමට බලකිරීමට ;

(ආ) ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීමට ; සහ

(ඇ) සාක්ෂිකරුවන් ලවා දිවුරුම් හෝ ප්‍රතිඥා කරවීමට

දිසා අධිකරණයක් සතු සියලු බලතල තිබිය යුතු ය.

විනිශ්චය අධිකාර සමුවේ නඩු කටයුතු.

9උ. මේ පනත යටතේ යම් නඩු කටයුත්තක දී විනිශ්චය අධිකාරය විසින් දිසා අධිකරණයක කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු අතර එහි ආඥා සහ තීන්දු ක්‍රියාත්මක කිරීමේ දී දිසා අධිකරණයක් සතු සෑම බලයක් ම එයට තිබිය යුතු ය. සිවිල් නඩු විධාන සංග්‍රහයේ දිසා අධිකරණයක කාර්ය පටිපාටිය සහ ක්‍රියාත්මක කිරීමේ බලතලවලට අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, විනිශ්චය අධිකාරයේ ක්‍රියාපටිපාටි සහ ක්‍රියාත්මක කිරීමේ බලතල විෂයෙහි සහ ඒවා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මණ්ඩලයේ ආඥා යනාදියෙන් විනිශ්චය අධිකාරය වෙත අභියාචනා.

9ඌ. (1) මණ්ඩලයේ ආඥාවකින් හෝ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ ආඥාවේ හෝ තීරණයේ දින සිට දින තිහක් ඇතුළත ඒ ආඥාවට හෝ තීරණයට විරුද්ධව විනිශ්චය අධිකාරය වෙත ලිඛිතව අභියාචනයක් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද අභියාචනයක් විභාග කිරීමේ හා තීරණය කිරීමේ කාර්ය සඳහා විනිශ්චය අධිකාරයට පහත සඳහන් බලතල තිබිය යුතු ය:—

(අ) මණ්ඩලය ඉදිරියේ වූ යම් කටයුත්තක වාර්තාව සහ මණ්ඩලය සතුව ඇති යම් ලියවිලි ඉදිරිපත් කරන ලෙස දැන්වීමට ; සහ

(ආ) අභියාචනය සඳහා අවශ්‍ය වන යම් පරීක්ෂණ කිරීමට සහ එය යෝග්‍ය යයි අදහස් කරන්නේ නම් වාචික හෝ ලේඛනමය සාක්ෂි ආවේශ්‍ය කිරීමට හා කැඳවීමට.

(3) අභියාචනයක් විභාග කිරීමෙන් ඉක්බිතිව විනිශ්චය අධිකාරය විසින් මණ්ඩලයේ ආඥාව හෝ තීරණය ස්ථිර කරමින්, ඉවත ලමින් හෝ වෙනස් කරමින් ආඥාවක් කළ යුතු ය; නැතහොත් ඒ පිළිබඳව එය යෝග්‍ය යයි සිතන්නා වූ වෙනත් යම් ආඥාවක් කළ යුතු ය.

මුස්ලිම් පුණ්‍යභාර හෝ වකුෆ් භාර සම්බන්ධයෙන් අදාළ කාරණා විභාග කිරීමට විනිශ්චය අධිකාරයට අනන්‍ය අධිකරණ බලය තිබිය යුතු බව.

9එ. මුස්ලිම් පුණ්‍ය භාරවලට හෝ වකුෆ් භාරවලට අදාළ කාරණා සම්බන්ධයෙන් විනිශ්චය අධිකාරය විසින් ක්‍රියාත්මක කළ හැකි අධිකරණ බලය අනන්‍ය වන අතර, එම අධිකරණ බලය ඇතුළත ගැනෙන කිසිදු කාරණයක් කවර හෝ මූල් අවස්ථා අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් විභාග කිරීම හෝ පරීක්ෂා කිරීම හෝ නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) 13 වන වගන්තිය යටතේ මුස්ලිම් පල්ලියක් ලියාපදිංචි කරනු ලැබූ පසු හැකිතාක් ඉක්මණින්,—

(අ) මුස්ලිම් පල්ලියේ පරිපාලනය සම්බන්ධයෙන් බලපවත්නා ව්‍යවහාර, රීති, නියෝග හෝ වෙනත් වැඩ පිළිවෙළවල් අනුව තෝරා ගනු ලැබූ හෝ නම් කරනු ලැබූ භාරකරු නැතහොත් භාරකරුවන් වශයෙන් තැනැත්තකු හෝ තැනැත්තන් ස්ථිර කිරීම සහ පත් කිරීම මණ්ඩලය විසින් කළ යුතු ය;

(ආ) (අ) ඡේදය යටතේ භාරකරුවකු හෝ භාරකරුවන් පත් කරනු නොලැබුවහොත්, මුස්ලිම් පල්ලියේ ජමාත් සභාවේ ලියාපදිංචි සාමාජිකයන් අතුරින් යම් තැනැත්තකු හෝ තැනැත්තන්, භාරකරු හෝ භාරකරුවන් වශයෙන්, මණ්ඩලය විසින් පත් කළ හැකි ය;

(ඇ) මුස්ලිම් පල්ලියේ නිසි පරිපාලනය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකනහොත් යම් නිශ්චිත කාලයක් සඳහා විශේෂ භාරකරුවකු හෝ භාරකරුවන් මණ්ඩලය විසින් පත් කළ හැකි ය;";

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මණ්ඩලය විසින් භාරකරුවකු වශයෙන් පත් කරනු ලබන සෑම තැනැත්තකු ම—

(අ) මුස්ලිම් පල්ලියේ පරිපාලනය සම්බන්ධයෙන් බල පවත්නා ව්‍යවහාර, රීති, නියෝග හෝ වෙනත් වැඩ පිළිවෙළවල් මගින් විධිවිධාන සලසා ඇති කාලය සඳහා භාරකරුවකු ලෙස කටයුතු කළ යුතු ය; නැතහොත්

(ආ) 15 වන වගන්තිය යටතේ ඔහු ධුරය අත්හළහොත් හෝ භාරකරුවකු වශයෙන් ඔහුගේ පත් කිරීම මණ්ඩලය හෝ විනිශ්චය අධිකාරය විසින් ප්‍රත්‍යාදිෂ්ට කළහොත් මිස, පත් කිරීමේ සාධන පත්‍රයෙහි නිශ්චය කර ඇති කාලය සඳහා භාරකරු ලෙස කටයුතු කළ යුතු ය;";

(ඇ) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3අ) (අ) මුස්ලිම් පල්ලියේ පරිපාලනය සම්බන්ධයෙන් බලපවත්නා ව්‍යවහාර, රීති, නියෝග හෝ වෙනත් වැඩපිළිවෙළවල් සම්බන්ධයෙන් විධිමත්ව සහතික කරන ලද පිට පතක්; සහ

(ආ) මුස්ලිම් පල්ලියේ ජමාත් සභාවේ තත් කාලයෙහි ලියාපදිංචි කර ඇති සාමාජිකයන්ගේ නාමලේඛනයේ පිටපතක්

අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කිරීම මුස්ලිම් පල්ලියක භාරකරුවකුගේ හෝ භාරකරුවන්ගේ කාර්ය විය යුතුය;";

(ඈ) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම උපවගන්තියේ (ඊ) ඡේදය එම උපවගන්තියේ (උ) ඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්; සහ

(ආ) එම උපවගන්තියේ නැවත අක්ෂර යෙදූ (උ) ඡේදයට පෙරාතුවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඊ) ඔහු ජුම්මා මුස්ලිම් පල්ලියක භාරකරු වන අතර වෙනත් ජුම්මා මුස්ලිම් පල්ලියක භාරකාර ධුරය දරතහොත්;

එසේ වුව ද, එක් විශේෂ ප්‍රදේශයක පවත්නා දීර්ඝ භාවිතය හෝ ව්‍යවහාරය අනුව එක් ජුම්මා මුස්ලිම් පල්ලියකට වඩා වැඩි සංඛ්‍යාවක් එක් පොදු භාරකාර මණ්ඩලයක් විසින් පරිපාලනය වන අවස්ථාවක දී, එක් ජුම්මා

මුස්ලිම් පල්ලියක භාරකරුවකුට වෙනත් ප්‍රම්මා මුස්ලිම් පල්ලියක භාරකාර ධුරය දැරිය හැකි ය; නැතහොත් ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 අ වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ වගන්තිය, එම වගන්තියේ (5) වන උපවගන්තිය අවසානයට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇ) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද (3) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් කරන ලද ආඥාවක් ක්‍රියාත්මක කිරීම, එම ආඥාව වෙනස් කිරීමේ හෝ ඉවත් කිරීමේ අදහස ඇතිව වෙනත් අධිකරණයක දී අභියාචනය කිරීමෙන් හෝ ගන්නා වූ හෝ ගැනීමට බලාපොරොත්තු වන්නා වූ වෙනත් පිය වරක් මගින් හෝ කවර වූ හෝ ආකාරයකින් නතර කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, "මණ්ඩලයේ අනුඥාව" යන වචන වෙනුවට "අධ්‍යක්ෂවරයාගේ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකුගේ හෝ බලය ලත් නිලධරයකුගේ අනුඥාව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**15.** පහත දැක්වෙන අලුත් වගන්තිය 20 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" බලයලත් නිලධරයෝ සහ ඔවුන්ගේ කර්තව්‍ය.

**20අ.** (1) මේ පනතේ කාර්ය සඳහා බලයලත් නිලධරයන් වශයෙන් අවශ්‍ය වන්නා වූ යම් බලය ලත් නිලධරයන් සංඛ්‍යාවකට අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබිය හැකි ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් තත්කාර්යය සඳහා උපදෙස් දෙනු ලැබීමෙන් පසු බලයලත් නිලධරයකු විසින්—

(අ) යම් තැනැත්තකු මේ පනතේ යම් විධි විධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ උල්ලංඝනය කර ඇද්දැයි විමසා දැනගත යුතු ය;

(ආ) 21 වන වගන්තිය, 22 වන වගන්තිය, 25 වන වගන්තිය සහ 29 වන වගන්තිය යටතේ මණ්ඩලයට ඉල්ලීම් කළ යුතු ය;

(ඇ) මණ්ඩලයේ හෝ විනිශ්චය අධිකාරයේ හෝ යම් අධිකරණයක අවශ්‍ය විය හැකි පරිදි නඩු පැවරීම හෝ නඩු කටයුතු ආරම්භ කිරීම හෝ එවැන්නක දී විත්ති වාචක ඉදිරිපත් කිරීම කළ යුතු ය;

(ඈ) ලියාපදිංචි මුස්ලිම් පල්ලියක භාරකරු හෝ භාරකරුවන් විසින් කරන ලදැයි කියැවෙන යම් වංචාවක් හෝ දේපළ

අයථා පරිහරණයක් ගැන විමර්ශනය කර වාර්තා කිරීම හෝ එය මණ්ඩලයට, අධ්‍යක්ෂවරයාට හෝ යම් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකුට දැනුම් දීම කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තිය 21 වන වගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(3) එම වගන්තියේ එන "එම මුස්ලිම් පල්ලියේ භාරකරුට හෝ භාරකරුවන්ට විධාන කිරීමට" යන වචන වෙනුවට "බලය ලත් නිලධරයකුට විධාන කිරීමට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ එන "එම මුස්ලිම් පල්ලියේ භාරකරුට හෝ භාරකරුවන්ට විධාන කිරීමට" යන වචන වෙනුවට "බලයලත් නිලධරයකුට විධාන කිරීමට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ එන "ලියාපදිංචි කරන ලද මුස්ලිම් පල්ලියක භාරකරු නැතහොත් භාර කරුවන්" යන වචන වෙනුවට "බලයලත් නිලධරයකු හෝ ලියාපදිංචි කරන ලද මුස්ලිම් පල්ලියක භාරකරු නැත හොත් භාරකරුවන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) ලියාපදිංචි කළ මුස්ලිම් පල්ලියක භාරකරු හෝ බලයලත් නිලධරයකු යම් නඩුවක පැමිණිලිකරු වුවද

විත්තිකරු වුවද ඔහු විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ තම කාර්ය ඉටු කිරීමේ දී සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවන් සම්බන්ධයෙන් නඩු ගාස්තු ගෙවීමට ඔහු පෞද්ගලිකව ම යටත් නොවන්නේ ය.";
සහ

(ඈ) එම වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"බලයලත් නිලධරයා හෝ ලියාපදිංචි මුස්ලිම් පල්ලියක භාරකරු හෝ භාරකරුවන් විසින් නඩු පැවරිය හැකි බව.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (ඇ) ඡේදයෙහි එන, "මණ්ඩලය විසින්" යන වචන වෙනුවට, "මණ්ඩලය හෝ යම් බලයලත් නිලධරයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (6) වන උපවගන්තියෙහි ඇති "තීන්දු ප්‍රකාශයක් ලබා ගැනීම පිණිස එසේ සම්බන්ධතාවක් ඇති වෙනත් යම් තැනැත්තකු පැමිණිලිකරු වශයෙන් සම්බන්ධ නොකර එම මුස්ලිම් පල්ලියේ භාරකරුට විරුද්ධව එම මුස්ලිම් පල්ලිය පිහිටා ඇති ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයේ නඩුවක් පැවරීමට" යන වචන වෙනුවට "ආඥාවක් ලබා ගැනීම පිණිස එම මුස්ලිම් පල්ලියේ විනිශ්චය අධිකාරය වෙත ඉල්ලීමක් කළ හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(7) අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන ඉල්ලීමක් හැර වෙනත් කවර වූ හෝ ඉල්ලීමක් මණ්ඩලය විසින් අනුමත කරන ලද බවට අධ්‍යක්ෂවරයාගේ අත්සන සහිත සහතිකයක් සමග ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස එය මේ වගන්තිය යටතේ විනිශ්චය අධිකාරය විසින් සලකා නොබැලිය යුතු ය"; සහ

(3) එම වගන්තියේ (9) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(9) මුස්ලිම් පල්ලියක් පිළිබඳව සම්බන්ධතාවක් ඇති තැනැත්තන් පස් දෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් (6) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කර ඇති අවස්ථාවක එයින් එක් තැනැත්තකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඒ ඉල්ලීම කිරීමෙන් ඉවත් වීම, ඉල්ලීම කළ තැනැත්තන්ගෙන් යටත් පිරිසෙයින් එක් අයෙකු හෝ පාර්ශ්වකරුවකු වශයෙන් සිටින තාක් කල් එකී ඉල්ලීම විභාග කර තීරණය කිරීමෙන් විනිශ්චය අධිකාරය නොවැළැක්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ එන, "මණ්ඩලය විසින්" යන වචන වෙනුවට, "මණ්ඩලය හෝ යම් බලයලත් නිල ධරයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි ඇති "පහත දැක්වෙන කාර්ය සියල්ලම හෝ ඉන් කවරක් හෝ සඳහා" යන වචනවලින් ඇරඹී එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"පහත දැක්වෙන කාර්ය දෙකම හෝ ඉන් එකක් සඳහා :—

(අ) භාරය හෝ වකුප් භාරය සංයුක්ත වන දේපළ වෙන් වශයෙන් දැක්වීම ; සහ

(ආ) අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වන වැඩිපුර සහ වෙනත් සහන ප්‍රදානය කිරීම"; සහ

(ආ) එම වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියෙහි "අධිකරණය" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "විනිශ්චය අධිකාරය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියෙහි පාර්ශ්ව සටහනේ "අධිකරණයේ බලතල" යන වචන වෙනුවට "විනිශ්චය අධිකාරයේ බලතල" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය, එහි ඇති "අධිකරණය" යන වචනය වෙනුවට "විනිශ්චය අධිකාරය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "යම් නඩුවක් පවරන ලද අවස්ථාවක" යන ස්ථානයේ සිට "පහත දැක්වෙන සියලුම කාර්ය හෝ ඉන් කවර වූ හෝ කාර්යයක් සඳහා" යන ස්ථානය දක්වා වූ සියලු වචන සහ අංක සඳහා පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"29 වන වගන්තිය යටතේ විනිශ්චය අධිකාරය වෙත යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, විනිශ්චය අධිකාරය විසින් 29 වන වගන්තිය යටතේ ස්වකීය ආඥාවෙන් විධිවිධාන සැලැස්විය හැකි කරුණුවලට

අතිරේකව, මෙහි පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යමක් හෝ සඳහා ද ඒ ආඥාවෙන් විධිවිධාන සැලැස්විය හැකි ය." ; සහ

(ආ) එම වගන්තියෙහි පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"29 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් විනිශ්චය අධිකාරයේ අතිරේක බලතල.".

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන සහ 49 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන සහ 49 වන වගන්ති ඉවත් කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය ඉවත් කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක කාලයක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි ඇති "හෝ මුස්ලිම් පල්ලියක භාරකරුවන්ගේ" යන වචන වෙනුවට "හෝ විනිශ්චය අධිකාරයේ හෝ මුස්ලිම් පල්ලියක භාරකරුවන්ගේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර එසේ අනුමත කරනු ලැබූ කල්හි මේ පනතේ විධිවිධානයක් මෙන්ම බලාත්මක හා ක්‍රියාත්මක විය යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට එයින් හානියක් නොවිය යුතු ය."; සහ

(ඇ) (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 55අ සහ 55ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**30.** මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති, ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 55අ වන වගන්තිය සහ 55ආ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"අභියාචන.

55අ. විනිශ්චය අධිකාරය විසින් කරනු ලබන සෑම ආඥාවක් ම දිසා අධිකරණයක් විසින් කරන ලද ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර දිසා අධිකරණයක ආඥා සහ තීන්දු ප්‍රකාශ සම්බන්ධ අභියාචනවලට බලපාන්නා වූ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, විනිශ්චය අධිකාරයේ ආඥා පිළිබඳ අභියාචනවලට සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අපහාස නඩු කටයුතු.

55ආ. විනිශ්චය අධිකාරයේ බලයට එරෙහි වූ අපහාස සම්බන්ධ වැරදි ගැන ක්‍රියා කිරීමේ කාර්යය සඳහා විනිශ්චය අධිකාරයට දිසා අධිකරණයක් සතු බලතල තිබිය යුතු අතර, ඒ අනුව 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 55 වන වගන්තියේ විධිවිධාන, එහි දිසා අධිකරණය පිළිබඳ සෑම සඳහනක් ම විනිශ්චය අධිකාරය පිළිබඳ සඳහනක් වූවා සේ, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.".

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57අ වන වගන්තිය එහි ඇති " ආගමික ස්ථානයකට වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතත් ", යන වචන වෙනුවට " ආගමික ස්ථානයකට සංස්ථාගත කරනු ලැබුව ද නොලැබුව ද, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, එමෙන් ම අධිකරණයක් මගින්, මුස්ලිම් පල්ලියක, මුස්ලිම් සිද්ධස්ථානයක හෝ ආගමික ස්ථානයක පරිපාලනය සම්බන්ධයෙන් කවර ආඥාවක් කර තිබුණ ද " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 57අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 57අ යන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 57ඇ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 ඇ වන වගන්තිය ඇතුළත් කිරීම.

" දණ්ඩන සහ දඩ මුදල් අය කර ගැනීමේ කාර්ය පටිපාටිය.

57ඇ. විනිශ්චය අධිකාරය හෝ අභියාචනාධිකරණය විසින් නියම කරන ලද යම් දඩ මුදලක් හෝ දණ්ඩනයක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, වෙනත් යම් නීතියකින් කවර සීමා පනවා තිබුණ ද එම ගෙවීම පැහැර හැරි තැනැත්තා තත්කාලයෙහි පදිංචිව සිටින ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත බලයලත් නිලධරයකු විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත අය කර ගනු ලැබිය හැකි ය. ".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) " මණ්ඩලය " යන්නෙහි අර්ථකථනයට පෙරාතුවම මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

' " බලයලත් නිලධරයා " යන්නෙන් මේ පනතේ කාර්ය සඳහා බලයලත් නිලධරයකු ලෙස ක්‍රියා කිරීම සඳහා බලය දෙනු ලැබූ නිලධරයෙක් අදහස් වේ ; ' ;

(ආ) " ජමාත් " යන්නෙහි අර්ථකථනය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' " ජමාත් " යන්නෙන් මුස්ලිම් පල්ලියක් සම්බන්ධයෙන් වන විට, ඒ මුස්ලිම් පල්ලියෙහි සාමාන්‍යයෙන් වන්දනාමාන කරන්නා වූ හෝ ආගමික හෝ ව්‍යවහාරික චාරිත්‍රවිධි හා කටයුතුවල යෙදෙන්නා වූ ද තත්කාලයෙහි ඒ මුස්ලිම් පල්ලියේ සාමාජික නාම ලේඛනයෙහි නම සඳහන් වන්නා වූ ද තැනැත්තන් අදහස් වේ ; ' ;

(ඇ) " සාමාජිකයා " යන්නෙහි අර්ථකථනය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"සාමාජිකයා" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ හෝ විනිශ්චය අධිකාරයේ සාමාජිකයකු අදහස් වේ;';

(ඈ) "සාමාජිකයා" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"අමාත්‍යවරයා" යන්නෙන් මුස්ලිම් කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ;';

(ඉ) "මුස්ලිම් පල්ලිය" යන යෙදුමෙහි අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"මුස්ලිම් පල්ලිය" යන්නෙන්, යම් නිකායක හෝ ජමාත් සභාවක නැතහොත් නිකායක් හෝ ජමාත් සභාවක් සඳහා මුස්ලිම් වන්දනාමාන සඳහා ම වෙන් වී ඇති සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ ස්ථානයක් අදහස් වන අතර, යම් මුස්ලිම් පල්ලිය කට අනුබද්ධ වූ හෝ නොවූ යම් තක්කියක් හෝ සාවියක් ඊට ඇතුළත් වේ;';

(ඊ) "මුස්ලිම් සිද්ධස්ථාන සහ ආගමික ස්ථාන" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"ඒ පත්වීමේ දිනයට පෙරාතුව ම කවර වූ හෝ තත්ත්වයකින් සන්තකය, භාරය හෝ යථා පාලනය සතුව සිටි තැනැත්තා හෝ තැනැත්තන්" යන්නෙන් වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද කවරාකාරයකින් හෝ යම් භාරයක, ඔප්පුවක හෝ ලේඛනයක විධිවිධානවලට පටහැණිව ඒ මුස්ලිම් පල්ලියට අයත් වූ හෝ කවර වූ හෝ ආකාරයකින් සම්බන්ධ වූ හෝ එහි ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද්දා වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් සතුව සිටින, එහි පදිංචිව සිටින, එය අන්සතු කරන, අත්කර ගන්නා හෝ අයුතු ලෙස ඇතුළුවීමේ වරද කරන යම් තැනැත්තකු අදහස් වේ;';

(උ) "නියමිත" යන්නෙහි අර්ථ කථනයෙහි "අදහස් වේ; තවද" යන වචන වෙනුවට "අදහස් වේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඌ) "ලියාපදිංචි මුස්ලිම් පල්ලිය" යන යෙදුමෙහි අර්ථ කථනයේ "මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් මුස්ලිම් පල්ලියක් අදහස් වේ." යන වචන වෙනුවට "මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් මුස්ලිම් පල්ලියක් අදහස් වේ; තවද" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(එ) "ලියාපදිංචි මුස්ලිම් පල්ලිය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

'"විනිශ්චය අධිකාරය" යන්නෙන් මේ පනත යටතේ පිහිටුවනු ලැබූ වකුප් විනිශ්චය අධිකාරය අදහස් වේ.'.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(අ) ඒ උපලේඛනයේ 1 වන ඊතිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඊතිය ආදේශ කිරීමෙන් :—

"1. ලියාපදිංචි මුස්ලිම් පල්ලියක්, මුස්ලිම් පුණ්‍ය භාරයක් හෝ වකුප් භාරයක් වෙනුවෙන් මුස්ලිම් පුණ්‍ය අරමුදලට කවර හෝ වර්ෂයක් සඳහා ගෙවිය යුතු දායක මුදල් අනුප්‍රමාණය, ඒ වර්ෂයේ ශුද්ධ ආදායමෙන් සියයට හයක් විය යුතු ය."; තවද

(ආ) ඒ උපලේඛනයේ 2 වන ඊතියේ "සියයට 25 ක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට 10 ක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

35. මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තිය මගින් වකුප් විනිශ්චය අධිකාරයේ අනන්‍ය අධිකරණ බල සීමාවට ඇතුළත්ව ඇති කාරණා සම්බන්ධයෙන්, ඒ යම් කාරණාවක් සම්බන්ධයෙන් වූ නඩු තීන්දුවකට හෝ ආඥාවකට විරුද්ධව අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසන් නොවී පවතින යම් අභියාචනයක් හැර, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව මැවුදිනයෙහි යම් අධිකරණයක අවසන් නොවී පවත්නා සියලු කාරණා, නඩු හෝ නඩු කටයුතු, විභාග කොට තීරණය කිරීම හෝ පවත්වාගෙන ගොස් අවසන් කිරීම හෝ සඳහා වකුප් විනිශ්චය අධිකාරය වෙත, මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි සිට භාර කෙරෙන්නේ ය. අන්තර් කාලීන විධිවිධාන.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය